# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 971 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 09/06/2024 පැය 1900

**මාධ්‍ය නිවේදනය**

**ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා හට ජීවිත තර්ජනයක් නොමැති බැවින් විමර්ශන අවශ්‍ය නොවන බව ප්‍රකාශ කිරීම - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.**

2024.06.08 වන දින පැය 1820ට ඔබ වෙත නිකුත් කරන ලද 965/2024 මාධ්‍ය නිවේදනය හා බැදේ.

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා වෙත ජීවිත තර්ජනයක් ඇති බවට පාර්ලිමේන්තුවේදී ඔහු විසින් සිදුකල ප්‍රකාශය අනුව ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමා විසින් පොලිස්පතිතුමා වෙත ලබා දෙන ලද නියෝග පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ පිළිබඳ විමර්ශනයක් ආරම්භ කර ඒ මහතාට ප්‍රකාශයක් ලබා දීම සඳහා කටයුතු කරන ලෙසට එම දෙපාර්තමේන්තුව විසින් දැනුම් දීමට කටයුතු කරන ලදී.

ඒ අනුව ගරු මන්ත්‍රීතුමා විසින් එයට පිළිතුරු ලබා දෙමින් ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමාටත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් එම කාරණය සම්බන්ධයෙන් ස්තූතිය ප්‍රකාශ කරමින් සඳහන් කර ඇත්තේ එම ප්‍රකාශය පාර්ලිමේන්තු වරප්‍රසාද සහිතව පාර්ලිමේන්තුවේදී සිදුකල ප්‍රකාශයක් බවත්, එය සිදුකරන අවස්ථාවේ ගරු කථානායකතුමා විසින් ඔහුට ජීවිත තර්ජනයක් තිබෙනවාද යන්න විමසූ බවත් එවැන්නක් නොමැති බව ඔහු ප්‍රකාශ කල බවත්ය.

ඒ අනුව ඔහුට දැනට එවැනි ජීවිත තර්ජනයක් නොමැති බැවින් එවැනි විමර්ශනයක් පවත්වාගෙන යාම අවශ්‍ය නොවන බවත්, එසේ අවශ්‍ය වන්නේ නම් නැවත දැනුම් දීමට කටයුතු කරන බව පවසා ඇත. මේ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගරු කථානායකතුමා වෙතද දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**